# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1906/17 - 2015 මාර්තු මස 17 වැනි අඟහරුවාදා - 2015.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.1/2003.

### 2002 අංක 25 දරන සාපරාධී කරුණුවලදී අන්‍යොන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත

2 වන වගන්තිය යටතේ නියමය

2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යොන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ, 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම, මේ නියමය මගින් ඉහත කී පනතේ විධිවිධාන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ එක්සත් අරාබි එමීර් ආණ්ඩුව අතර, දෙදහස් දහහතරේ ජනවාරි මස විසි හත් වන දින අබුඩාබි හී දී ඇති කර ගනු ලැබූ ගිවිසුම සම්බන්ධයෙන් අදාළ වන බවට ප්‍රකාශයට පත් කරමි. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් නොවන එක්සත් අරාබි එමීර් ආණ්ඩුව අතර ඇති කර ගනු ලැබූ මෙම ගිවිසුම සාපරාධී කාරණාවලදී අන්‍යොන්‍ය නෛතික සහයෝගය ලබාදීම සම්බන්ධයෙන් අදාළ වන අතර එය වෙනත් කරුණු අතර, ඔවුන්ගේ අදාළ අධිකරණ බල සීමා තුළ සංවිධානාත්මක අපරාධ ඇතුළුව අපරාධ වැළැක්වීම, විමර්ශනය, නඩු පැවරීම සහ මැඩපැවැත්වීම සම්බන්ධයෙන් ගිවිසුමට අදාළ පාර්ශවයන් දෙක විසින් නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ඵලදායී බව සහයෝගීතාව තුළින් වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ද අදාළ වේ.

අංක 1877/54 දරන සහ 2014.08.29 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමය, ඒ යටතේ සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

විජයදාස රාජපක්ෂ,<br>
අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය.

2015 පෙබරවාරි මස 19 වැනි දින,<br>
කොළඹ දීය.

04 - 74

1A - PG 2404 — 405 (2015/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*